චක්‍රලේඛ අංක. 147/86

මගේ අංකය: 201/නීති/චක්‍ර.
සමුපකාර සේවක කොමිෂන් සභාව,
ගාලුමුවදොර - කොළඹ 03.
1986 මාර්තු මස 11 දින.

සියළුම සමුපකාර සමිති ගරු සභාපතිවරුන් වෙත.

## සමුපකාර සමිති සේවකයින්ට වැඩ බැලීමේ වැටුප් ගෙවීම.

සමුපකාර සේවකයින්ට වැඩ බැලීමේ වැටුප් ගෙවීම සම්බන්ධයෙන් දිවයිනේ සමුපකාර සමිතිවලින් කොමිෂන් සභාව වෙත ලැබී ඇති විමසීම් පිළිබඳ සාකච්ඡා කරන ලදුව වැඩ බැලීම් වැටුප් ගෙවීම පිළිබඳව කොමිෂන් සභාවේ තීරණයන් පහත සඳහන් පරිදි උපදෙස් දෙමි. සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයාගේ අංක. 12/14/73/136 හා 73.09.10 දින චක්‍රලේඛයක් සමග යවා ඇති ආදර්ශ සාරක නියෝග වලින් මේ සම්බන්ධයෙන් අන්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නේ නම් සාරක නියෝගයද පහත සඳහන් පරිදි සංශෝධනය කර ගන්නා මෙන් උපදෙස් දෙනු ලැබේ.

2:1 නියම තනතුරේ වැඩ කිරීමට අමතරව ඉහල තනතුරක වැඩ බලන විට එම සේවකයාට ඔහුගේ නියම තනතුරේ වැටුපට අමතරව වැඩ බලන තනතුරේ මූලික වැටුපෙන් (1/4) කාලෙන් පංගුවක් ද වැඩ බලන වැටුප් වශයෙන් ගෙවිය යුතුය.

2:2 නියමතනතුරේ වැඩ නොකර යම් සේවකයෙකු වැඩ බැලීමේ තනතුරකට අදාළ රාජකාරි කටයුතුවල පමණක් නිරත වන්නේ නම් ඔහුට වැඩ බලන තනතුරේ මූලික වැටුපෙන් (1/2) දෙකෙන් එකක් සහ ඔහුගේ නියම තනතුරේ වැටුපෙන් (1/2) භාගයක් සහ නියම තනතුරේ උපයා ඇති සියළුම වැටුප් වර්ධක එකතු කර වැඩ බලන වැටුප් වශයෙන් ගෙවිය යුතුය.

2:3 යම් සේවකයෙකු නියම තනතුරකට වඩා උසස් තනතුරක වැඩ බලන්නේ නම් ඔහුගේ නියම තනතුරේ වැටුප් වැඩ බලන තනතුරේ මූලික වැටුපට සමාන හෝ වැඩි වන්නේ නම් ඔහුගේ නියම තනතුරේ වැටුපට වැටුප් වර්ධක දෙකක් එකතු කර හෝ වැඩ බලන තනතුරේ වැටුප් පරිමාණයේ උපරිමය යන දෙකෙන් අඩු ප්‍රමාණය ගෙවිය යුතුය.

2:4 2:1 සහ 2:2 සහ 2:3 යටතේ ගෙවීම් කරනු ලබන අවස්ථාවලදී වැටුපට අමතරව දෙනු ලබන සියළුම දීමනා ගෙවිය යුත්තේ වැඩ බැලීමේ පත්වීම ලැබූ සේවකයාගේ නියම තනතුරට අදාල ව ගෙවනු ලබන වැටුප පදනම් කර ගෙනය.

2.....

03. මෙම සේවා තල යුත්තේ පහත සඳහන් කොන්දේසිවලට යටත්වය.

3:1 වැඩ බැලීමේ පත්වීම සිවිලයේ ස්ථිර සේවකයෙකුට පමණක් පිරිනැමිය යුතු

3:2 වැඩ බැලීමේ වැටුප් ගෙවීමේ පරමාර්ථය නොවැලැක්විය හැකි අවස්ථාවක පිරිමයා ගැනීම වන හෙයින්, පුරප්පාඩු හැකි පමණ ඉක්මනින් පුරවා ගත යුතුය.

3:3 වැඩ බලන තනතුර වැඩ බැලීමට පත් කරන නිලධාරියා දරණ නිතය තනතුරට වඩා ඉහල හෝ සමාන විය යුතුය.

3:4 වැඩ බැලීමට පත් කිරීමට අදහස් කරන තනතුර පූර්ණකාලීන අනුමත තනතුරක් විය යුතුය. එම තනතුරට පූර්ණකාලීනව රාජකාරි කිරීමට පත්වීමක් යථා කාලයේදී කිරීමට බලාපොරොත්තු විය යුතුය.

3:5 වැඩ බැලීමේ වැටුප් ගෙවිය යුත්තේ අවම වශයෙන් අඛණ්ඩව එක් මාසික කාලයක් තනතුරේ වැඩ බලා ඇත්නම් පමණි.

ලේකම්,
සමුපකාර සේවා කොමිෂන් සභාව.

පිටපත්: 1. ආ. ස. ලේ.

2. ස. සං. කො/රේ.

පුපා/860311.